යාපනය මහ නගර සභාව

යාපනය දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

---------------------------------

සමාලෝචිත වර්ෂ්‍ය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 13 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 29 දින සභාවේ නගරාධිපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට යාපනය මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම.

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා

-------------------------

පහත සඳහන් නිරික්ෂණ සිදු කෙරේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ගිණුම්කරණ ඌනතා හා ආදායම්, බැරකම් සහ වියදම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මුල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම | | බැරකම් | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 397,450 | 02 | 497,191 | 02 | 25,754,931 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 898,833 | 03 | 532,002 | 01 | 81,089 |
| අත්හැරීම් | | | 02 | 149,991,300 | | |

(ආ) සභාවේ ඉඩම් හා ගොඩනැගිලි විටිනාකම තක්සේරු කර අවසන් ගිණුම් වල දක්වා නොතිබීම.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදි සභාවට පරිත්‍යාග කරනු ලැබූ යතුරු පැදි හතරක සහ කැටර්පිලර් යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර ගිණුම් වලට නොගැනීම නිසා ගිණුම් වල දැක්වුණු වාහන වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ ගිණුම්

(අ) අවසන් ගිණුම් වල දැක්වුණු රු.3,353,575 ක් වූ විවිධ ණයගැතියන් විවිධ ණයගැති ලේඛණ වල පෙන්නුම් නොකළ නිසා විවිධ ණයගැති ශේෂ සැසඳිය නොහැකි විය.

(ආ) ප්‍රධාන ලෙජරයේ රු.26,783,572 ක් ලෙස දැක්වුණු සේවක මණ්ඩල ණය අවසන් ගිණුම් වල රු.26,806,845 ක් ලෙස දක්වා තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා රු.14,688,096 ක් සඳහා වූ ගනුදෙනු 04 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

(ආ) රු.227,120,408 ක් සඳහා වූ 2013 වාර්ෂයේ විගණන විමසුම් තුනකට පිළිතුරු ලබා දි නොතිබුණි.

1.3.4 අනුකූල නොවීම්

----------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| මහ නගර සභා ආඥා පනත - 1987 පරිච්ඡේදය 252 වගන්තිය - 42(1) | - | තාවකාලික අනවසර කඩ 31 ක් ස්ථිර කඩ ලෙස පරිවර්තනය කර තිබුණි. එනමුත් මේ සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| | - | අනවසර විදුලි සංදේශණ 25 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| පරිච්ඡේදය 252 වගන්තිය - 188(ඕ) | - | අභිනන්දන උත්සව සඳහා රු.527,400 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 849(2) | - | නගරාධිපති හා සභා සාමාජිකයන්ගේ විදේශ දුරකථන ඇමතුම් සඳහා රු.91,681 ක් සභා අරමුදලෙන් දරා තිබුණි. |
| උතුරු පළාත් සභාවේ මුල්‍ය රීති 101 හා 102 | - | අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | - | වසර දෙක ඉක්ම වූ රු.3,682,524 ක් වූ විවිධ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 3-4 | - | රු.මිලියන දෙක ඉක්මවන මිලදී ගැණුම් සඳහා මිල කැඳවුම් පහකට නොඅඩු සංඛ්‍යාවක් ලබාගත යුතු වේ. එනමුත් රු.3,600,000 ක වාහන මිලදී ගැනිම් සඳහා මිල කැඳවුම් සිදුකර නොතිබුණි. |
| දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක 2011/07 දරන අගය එකතු කළ බදු චක්‍රලේඛයට අදාලව, යෙදවුම්/නිමැයුම් බද්ද | - | i. මයික්‍රෝ රයිනෝ වාහනයට අදාල රු.375,714 ක එකතු කළ අගය මත වූ බද්ද, යෙදවුම් හා නිමැයුම් බද්දට යටත් නොකර තිබුණි.<br>ii. පොම්පය සහිත තෙකලා මෝටරයට අදාල රු.86,383 ක් වූ එකතු කළ අගය මත වූ බද්ද යෙදවුම් බද්දට යටත් කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.61,717,687 ක් වූ අතර එයට අනුරූපි ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,988,563 ක් විය.

2.2 මුල්‍ය පාලනය

-------------------

විධිමත් අයවැය සැකසීමක් නොමැතිකම නිසා අයවැයගත හා තත්‍ය ආදායම අතර රු.198,886,695 ක් ද අයවැයගත හා තත්‍ය වියදම අතර රු.248,858,159 ක් ද වූ වෙනස්කම් පැවති බැව් විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

--------------------------------------------------------------------

නගරාධිපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම් තත්‍ය ආදායම් සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 21,403 | 59,462 | 46,157 |
| බදු කුලි | 64,270 | 59,726 | - |
| බලපත්‍ර ගාස්තු | 36,629 | 54,031 | - |
| වෙනත් ආදායම් | 604,420 | 354,615 | 162,970 |

2.3.2 ආදායම් නොලැබී යාම

---------------------------

2004-2013 කාල පරිච්ඡේදය තුලදී විදුලි සංදේශණ කුළුණු 09 ක් ඉදිකිරීම සඳහා සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. එනමුත් මේ දක්වා ඉදිකිරීම් සහතික ලබා දී තිබුණේ කුළුණු 03 ක් සඳහා පමණි. ඒ හේතුවෙන් රු.36,000 ක ආදායම් සභාවට නොලැබී තිබුණි.

2.3.3 හිඟ ආදායම්

------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ සඳහා වූ එකතුව රු.55,314,724 ක් වූ වරිපනම් හා බදු, බදු කුලී සහ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් නෛතික හෝ ඵලදායි ක්‍රියා පිළිවෙලක් ගෙන නොතිබුණි.

2.3.4 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලය තුලදී නොයෙකුත් ආඥා පනත් යටතේ රු.6,578,508 ක් වූ මුදලක් මහේස්ත්‍රාත් අධිකරණය යටතේ අයකරගෙන තිබුණි. දෙසැම්බර් මාසය සඳහා වූ රු.45,625 ක උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකරගෙන නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

-----------------

(අ) 2011 සහ 2012 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු.123,984,738 ක් වූ මුද්දර ගාස්තු වලින්, රු.59,966,058 ක් පමණක් ලැබිය යුතු මුද්දර ගාස්තු වශයෙන් පෙන්වා තිබුණි. මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා ඵලදායි පියවරක් ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු රු.29,781,810 ක් ලෙස දැක්වෙන ලැයිස්තුවක් ලැබී තිබුණි. එනමුත්, එය ගිණුම්ගත කර නොතිබුණි.

2.4 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුලදී කම්කරුවන් සඳහා රු.77,884,742 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. එනමුත් එම කම්කරුවන් පත් කිරීමේ ලිපි පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 දුරකථන ගාස්තු අයකිරීම.

---------------------------------

2014 අගෝස්තු 07 දිනැති විගණන විමසුමේ දැක්වෙන පරිදි සභිකයන් 13 දෙනෙකු විසින් ලබාගත් අනවසර දුරකථන ඇමතුම් ගාස්තු සඳහා ලැබිය යුතු රු.49,238 ක මුදල ඔවුන්ගෙන් අයකර ගන්නා බැව් නාගරික කොමසාරිස් විසින් දක්වා තිබුණි. එනමුත් මෙම වාර්තාවේ දින වන විටත් අයකිරීම් සිදුකර නොතිබුණි.

2.6 අනවසර කඩ කාමර

-------------------------

සභාව විසින් කුලියට දෙන ලද තාවකාලික කඩ කාමර ස්ථිර බිත්ති තනා බිම සිමෙන්ති ආදිය දමා ස්ථිර ගොඩනැගිලි බවට පත්ව තිබුණි. මෙම අනවසර ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.7 අයවිය යුතු කාර්ය මණ්ඩල ණය

--------------------------------------

වැඩ තහනම් කරනු ලැබූ/විශ්‍රාම ගිය සේවකයන් ගෙන් ලැබිය යුතු රු.748,354 ක් වූ හිඟ ණය ඔවුනගේ ඇපකරුවන්ගෙන් අයකිරිමට කටයුතු නොකර අවුරුදු 05 කට අධික කාලයක් තිස්සේ දිගින් දිගටම ගිණුම් වල පෙන්වා ගෙන එමින් තිබුණි.

2.8 නිෂ්ක්‍රිය සංචිත

-------------------

රු.34,973,890 ක් වූ ආදායම් සහ වියදම් ගිණුමේ වූ සංචිත නිෂ්ක්‍රියව පැවතිණි.

2.9 වාහන උපයෝජනය

--------------------------

i. සභාවේ වාහන 16 ක් සභා පරිශ්‍රෙය් ගාල්කර තිබුණි. ඉන් වාහන 05 අවුරුදු 10 කට අධික කාලයක් තුල භාවිත කර නොතිබුණි.

ii. මහනුවර, නුවර එළිය සහ කොළම දක්වා කිලෝමීටර් 1,238.3 ක් ධාවනයට යොදා ගත් අංක එන්එන් 7977 දරන වාහනයේ ධාවන සටහන් එම වාහනය භාවිතා කළ නිලධාරියා විසින් අත්සන් කර නොතිබුණි.

iii. හානි වී තිබූ මයිලෝ මීටර නිසා වාහන 8 කට අදාල ඉන්ධන පරිභෝජනය විගණනයේදී පරික්ෂා කළ නොහැකි විය.

2.10 අනාර්ථික ගණුදෙනු

----------------------------

කොමසාරිස්වරයාගේ අංශය සහ කර්මාන්ත බදු, ගිණුම්, මිලට ගැණුම්, සෞඛ්‍ය, ආයතන, සැලසුම්, ගිනි නිවාරණ, වාහන, වැඩබිම්, ආරක්ෂක, ආයුර්වේද සහ නල්ලූර් උප කාර්යාලය, විගණන ශාඛාව සහ ප්‍රාථමික පාසැල වැනි අංශ සඳහා වූ සම්පූර්ණ විදුලිය ගාස්තු ගෙවීම්

රු.926,057 ක් වුවද නගරාධිපතිගේ සාකච්ඡා ශාලාවට පමණක් රු.738,618 ක් විදුලි ගාස්තු වශයෙන් ගෙවා තිබුණි.

2.11 අනුමැතියකින් තොරව ගෙවූ වැටුප්

------------------------------------------

(අ) ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 8 වගන්තියට පටහැනිව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පත්වීම් ලිපියක් නොමැතිව, කාර්මික නිලධාරියෙකු පත්කර තිබූ අතර, සභාවේ මුදල් කමිටුව විසින් ගත් තීරණයක් මත රු.207,581 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) පරිපාලන නිලධාරියකු නැවත පත් කිරිම පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එනමුත් රු.64,684 ක් පොදු සභා තීරණයක් මත වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

2.12 නිෂ්ඵල වියදම්

-----------------

ජල කර්මාන්ත අංශය විසින් සකසන ලද ඇස්තමේන්තුවට අනුව කි.වො. 2.2 තෙකලා ජලයේ ගිල්විය හැකි ජල පොම්පයක් මිලට ගැනීමට අවශ්‍යව තිබුණි. එනමුත් සමාලෝචිත වර්ෂය තුල කි.වො.03 ජලයේ ගිල්විය හැකි ජල මෝටරයක් රු.805,964 කට සභාව විසින් මිලදී ගෙන තිබුණි. මෙම වාර්තාවේ දින වන විට 40% ක ධාරිතාවෙන් ක්‍රියාත්මක වූ මෙම ජලයේ ගිල්වන ජල පොම්ප 3 ක් කැඩී තිබූ අතර ජලයේ ගිල්වන ජල පොම්ප 2 ක් පමණක් ලේඛනගත කිරිමෙන් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණි. වැයකළ මුදල වසරක් තුලදී නිෂ්ඵල වී තිබුණි.

2.13 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) මෝටරයක් අලුත්වැඩියාව සඳහා රු.168,504 ක මුදලක් 2013 ඔක්තෝබර් 04 දින සී.ස.ඩිමෝ(පුද්ගලික) සමාගමට ගෙවා තිබුණි. සති 4 ක් තුලදී අළුත්වැඩියා කළයුතුව තිබූ මෝටරය, මෙම වාර්තාවේ දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තිරුනේල්වෙලි ජල සැපයුම් මධ්‍යස්ථානයේ ජලය සැපයිම නැවති තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැඩ සඳහා සභාව වෙත ප්‍රධානය කරන ලද රු.6,143,340 ක් වූ මුදල උපයෝජනය කර නොතිබුණි. ඒ වෙනුවට එම මුදල මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් මහජනයාට ලැබීමට තිබූ ප්‍රතිලාභ ලැබී නොතිබූ බැව් නිරික්ෂණය විය.

2.14 පද්ධති දුර්වලතා

---------------------

(අ) සභාවේ වාහන විසින් පරිභෝජිත ඉන්ධන සඳහා වෙන්වෙන්ව ලේඛණ පවත්වා නොතිබුණි. එම හේතුවෙන් වාහන වල ධාවන සටහන් වල දැක්වුණු ඉන්ධන පරිභෝජනය වෙන් වෙන්ව විගණනයේදි පරික්ෂා කළ නොහැකි විය.

(ආ) වැඩබිම් වල පවත්වා තිබූ වැඩ පත්‍රිකා සටහන් යාවත්කාලීන කර නොතිබූ බැවින් එක් එක් කාර්ය සඳහා වැය වූ කම්කරු වියදම පරික්ෂා කළ නොහැකි විය.

2.15 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

-----------------------------------

රු.3,212,962 ක වියදමක්, ඇස්තමේන්තු, ගිවිසුම් ආදිය නොමැතිව දැරූ වියදම් වශයෙන් ප්‍රාග්ධන 07 ක් පෙන්වා ඇතත්, මෙම වාර්තාවේ දිනය වනවිටත් මෙම කර්මාන්ත ආරම්භ කර නොතිබූ බැව් විගණනයේදි නිරික්ෂණය විය.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරිම

(ආ) ස්ථාවර තැන්පතු

(ඇ) ගිණුම්කරණය

(ඈ) පිරිස් පාලනය

(ඉ) පරිත්‍යාග

(ඊ) වාහන උපයෝජනය

(උ) මිශ්‍ර තැන්පතු

(ඌ) අයවැය